# මිනුලි



හංසගී රතඹේගොඩ

# මිනුලි

හංසගී රත්මේගොඩ
කතෘ

කුරුළු ලෑල්ල - 2021

මහාමායා බාලිකා විදුහල - මහනුවර
5 ශ්‍රේණිය D
2025/02/08

ISBN 978-624-208-368-1

# පිදුම

මේ මුළු ලෝකෙන්ම

මට වැඩියෙන්ම ආදරේ කරන............

මුළු ලෝකෙන්ම

මම වැඩියෙන් ආදරේ කරන............

මගේම ආදර

අම්මාටයි අප්පච්චිටයි

මේ පොත් පිංච පුද කර සිටිමි !

# පෙරවදන

සාහිත්‍ය දියුණු රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එළියට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුනාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබිම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක්වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක කාලෙක ලස්සන සුරංගනාවියක් ජීවත්වුණා. එයා අනිත් අය ගැන හිතලා අනිත් අයට උදව් කරමින් ජීවත් වුණා. ඔන්න ටික කාලයක් ගතවුණා. සුරංගනාවියට හිතුණා මිනිසුන් ජීවත්වෙන පොළොවට යන්න. ඉතින් සුරංගනාවිය පොළොවට ගියා. එයා දැක්කා ළමයි ගොඩක් සෙල්ලම් කරමින් ඉන්නවා. ඒ වුනාට එක ළමයෙක් විතරක් අයිනේ තිබුන කොටයක් උඩට වෙලා හරි දුකෙන් අනිත් අය සෙල්ලම් කරන දිහා බලාගෙන ඉන්නවා.

සුරංගනාවියට හුඟක් හිත රිදුනා. එතකොටම මලී කියන පුංචි ළමයා සුරංගනාවිය දැක්කා. එයා අනික් යාළුවන්ටත් සුරංගනාවිය පෙන්නුවා. ඒ හැමෝම සුරංගනාවිය ළඟට දුවගෙන ගියා. ඒ වුනාට අර කොටේ උඩ ඉඳගෙන හිටපු ළමයා සුරංගනාවිය ළඟට ගියේ නෑ.

මලී සුරංගනාවියගෙන් ප්‍රශ්නයක් ඇහුවා.

''ඔයාගේ නම මොකක්ද?''

''මගේ නම පිනි මුතු''

''ඔයා ආවේ කොහේ ඉඳල ද?''

''මම ආවේ දිව්‍ය ලෝකයේ ඉඳලා.''

හැමෝටම පුදුම හිතුනා. සුරංගනාවියටත් අහන්න ප්‍රශ්නයක් තිබුණා.

''ඇයි අරයා විතරක් ඔයාලගෙන් වෙන් වෙලා ඉන්නේ?, ඇයි ඔයාලා එයාලව සෙල්ලම් කරන්න ගන්නේ නැත්තේ?, මට ඒක හරි ප්‍රශ්නයක්''



''අප්පෝ එයාද, අපි එයාව ගණන් ගන්නේවත් නෑ'' කියලා මලී කිව්වා. ''ඇයි ඉතින් එහෙම කරන්නේ'' සුරංගනාවිය ඇහුවා.

එතකොට තව එක්කෙනෙක් කිව්වා. ''මොකද එයාට අපිට වගේ ලස්සන ඇඳුම් නෑ.''

තවත් එක්කෙනෙක් කිව්වා. ''එයාට තියෙන්නේ අපිට වගේ ලොකු ගේකුත් නෙමෙයි''' කියලා.

තවත් එක්කනෙක් කියනවා ''එයාට අපිට වගේ ලස්සන සෙල්ලම් බඩුත් නෑ''

''එයාගේ තාත්තට අපිට වගේ වාහනයකුත් නෑ''

''එයාට අපි කනවා වගේ රසම රස කෑමත් නෑ''

''එයාට ඉස්කෝලේ දාන්න සපත්තුත් නෑ, පෑන් පැන්සල්, පොත්, පාට පෑන්, පාටකූරු ඒ වගේම සල්ලිත් නෑ'' ළමයි හැමෝම එක්කෙනාට එක්කෙනා නොදෙවෙනිව කියාගෙන කියාගෙන යන්න පටන් ගත්තා.
''හරි හරි, ඕක දැන් නවත්තන්න.'' සුරංගනාවිය තරහින් කිව්වා.

''ඉතින් බලන්න ඔයාලා කොච්චර නරක ළමයිද''

''එයාට ඒ දේවල් නෑ කියලා, එයා දුප්පත් කියලා එයාව එහෙම කොං කරන එක වැරදියිනේ. එයත් ඔයාලා වගේමයි. නිකමට හිතන්න කවුරුහරි ඔයාලටත් එහෙම කරොත් ඔයාලගේ හිත රිදෙනවා නේද?''

හැමෝම එකිනෙකාගේ මූණෙන් මූණ බලා ගත්තා.



''මම ඔයාලට පොඩි කතාවක් කියන්නම්. මීට අවුරුදු හත අටකට පෙර සිදු වුණු දෙයක්.''

හැමෝම කෑ ගහලා ''හා'' කිව්වා.

''හැබැයි ඔයාලා හැමෝම පොරොන්දු වෙන්න ඕනේ එයාගෙන් සමාව ගන්න. ඒ වගේම ඔයාට උදව් කරන්න.'' හැමෝම ඒ දේට එකඟ වුණා.

''ඔන්න අපේ දිව්‍ය ලෝකෙත් ඒ වගේම කෙනෙක් හිටියා.''

''අෑ......ඒ කොහොමද? දිව්‍ය ලෝකෙත් ඉඳලා'' මලී කිව්වා. ''එමෙහ තමයි දිව්‍ය ලෝකෙත් ඒ වගේ කෙනෙක් හිටියා. හරි හරි දැන් මං කියන කතාව අහගන්නකෝ'' සුරංගනාවිය කිව්වා.

''දිව්‍ය ලෝකයේ අපේ ඉස්කෝලේ පන්තියේත් ඒ වගේම යාළුවෙක් හිටියා. එයාටත් අපිට වගේ ලස්සන ගෙයක් තිබ්බේ නෑ, ලස්සන ඇඳුම් තිබ්බේ නෑ, ඉස්කෝලෙට උනත් ගෙනාපු බඩු අපේ තරම් ලස්සනත් නෑ. හැබැයි එහෙම කියලා අපි කවදාවත් එයාව කොං කරෙත් නෑ.''

''ඒ ඇයි?'' මලී ඇහුවා.

''මොකද අපි හොඳ ළමයි හින්දා. අපි එයාව අසරණ කරන්නේ නැතුව අපිට පුළුවන් හැම විදිහටම අපි එයාට උදව් කරා.''

''ඒ කොහොමද?'' සඳුනි ඇහුවා.

''පන්තියේ ළමයි හැමෝම එයාට කෑම ගෙනත් දුන්නා, ඉස්කෝලෙට ඕන කරන බඩු ගෙනත් දුන්නා, අපේ අම්මලා එයාට ලස්සන ඇඳුම් අරන් දුන්නා, ලස්සන ගෙදරකුත් හදලා දුන්නා.'' අනික, අපි එයාට හරිම ආදරෙයි.

''එයාට හොඳට ඉගෙන ගන්නත් පුළුවන්. එයා අනිත් අයට හරිම ආදරෙයි. ඒ වගේම මෙයා හරිම කරුණාවන්තයි. එයාට අඩුපාඩුකම් ගොඩක් තිබුණාට හරිම දක්ෂ ළමයෙක්. එයත් අනිත් හැමෝටම පුළුවන් හැම වෙලාවෙම උදව් කරා.''

''ඔය ඇත්තමද?. ළමයි හැමෝම ඇහුවා. ''ඔව්'' සුරංගනාවිය උත්තර දුන්නා. ''දැන් තමයි ඔයාලා මට පොරොන්දුව ඉෂ්ට කරන්න ඕන වෙලාව'' සුරංගනාවිය කිව්වා. හැමෝම එක පාරම ''ඔව් අපි ඒ දේට ලෑස්ති'' කියලා කෑ ගහලා කිව්වා.

''හරි දැන් එක්කෙනෙක් ගිහිල්ලා එයාව මෙහාට එක්කගෙන එන්නකෝ. කවුද යන්නේ?'' ''සඳුනි ගිහිල්ලා එයාව එක්කගෙන එන්නකෝ''

සඳුනි දුවගෙන ගියා..... ''මේ අන්න ඔයාට එන්න කිව්වා.'' ''කවුද කිව්වේ ?''

''ඔයාම ගිහිල්ලා බලන්නකෝ'' සඳුනි කිව්වා.

ඒ දෙන්නම සුරංගනාවි ළඟට දුව ගෙන ආවා.

''අනේ මේ සුරංගනාවියක් ද? මගේ ඇස් දෙක අදහා ගන්නත් බෑ. මම මේ දකින්නේ හීනයක් ද?''



''ඔව් ඔව් ඔය සුරංගනාවියක්'' තිනුම් කිව්වා.

''ඔයාගේ නම මොකක්ද පැටියෝ?'' සුරංගනාවිය ඇහුවා.

''මගේ නම මිනුලි''

''අනේ ..ලස්සන නමක්නෙ ඔයාට තියෙන්නේ..

ඔයාගේ ගෙදර කොහෙද තියෙන්නේ?'' සුරංගනාවිය ඇහුවා.
''මම ඉන්නේ සපුමල් කන්දේ'' මිනුලි පිළිතුරු දුන්නා.

''හරි. ළමයි හැමෝම මට පොරොන්දු උන දෙයක් තියෙනවා කියන්න. අන්න ඒ දේ දැන් මිනුලිට කියන්න.'' සුරංගනාවිය ඉතාමත් කරුණාවෙන් කිව්වා.

''අපිට සමාවෙන්න මිනුලි. ඔයා අපි හැමෝටම සමාව දෙනව නේද? හැමෝම ඇහුවා.

''අනේ මම ඔයාලා කාගෙවත් එක්කවත් තරහ නෑ. ඔයාලා හැමෝටම මම සමාව දෙනවා.'' මිනුලි හරි ම අහින්සක විදිහට කිව්වා.

''හරි ළමයි.. දැන් හැමෝම ගෙවල්වලට යන්න. ගොඩක් හවස් වෙලා. අම්මලා බලාගෙන ඉන්නවනේ, මමත් දැන් දිව්‍ය ලෝකෙට යන්න ඕනේ. අපි ආයෙත් හෙට හමුවෙමු.''

හැමෝම ගෙවල් වලට ගියා.

මිනුලිට අද හරිම සතුටුයි. මිනුලි වෙනදාටත් වඩා ඉක්මනට ගෙදර දුවගෙන ගියා.

මිනුලි ගෙදර ගිහිල්ලා අම්මත් එක්ක කිව්වා ''අම්මේ අද හරිම පුදුම වැඩක් වුනානේ, අද හැමෝම මගෙත් එක්ක යාලුයි.'' කියලා.

''අම්මේ.. අම්ම නම් මම මේ දැන් කියන්න යන දේ කීයටවත් ඇත්තක් කියලා නම් හිතන එකක් නෑ.. අද සුරංගනාවියක් ආවනේ අපි සෙල්ලම් කරන තැනට...''

''ඈ... ඇත්තමද?'' අම්ම පුදුමයෙන් වගේ ඇහුවා.

''ඔව් අම්මේ... අපිටත් පුදුමයි.''

''හරි හරි දැන් නිදාගන්නකෝ'' අම්මා කීව්වා..

පසුදින උදේ ළමයි හැමෝම සෙල්ලම් කරන තැනට ආවා. සුරංගනාවියක් ඇවිත්.. අනේ! ඒත් මිනුලි නෑනේ..''කෝ අපේ මිනුලි'' සුරංගනාවිය ඇහුවා.

''මම උදේ එනකොට මිනුලිගේ අක්කව මුණ ගැහුණා මිනුලිට හොඳටම උණ කියලා කිව්වා.'' නිසලි කිව්වා.

''අනේ එහෙමද. අපි එහෙනම් මිනුලිව බලන්න යමු.'' සුරංගනාවිය කිව්වා.

''අපි මිනුලිට මොනවා හරි අරගෙන යමු නේද?'' සලනි කිව්වා.

''ඒක හොඳයි, එහෙනම් අපි සුප් එකකුයි පානුයි අරගෙන යමු. ආහ් තව පලතුරු ටිකකුත් ගෙනියමු'' සඳුනි කිව්වා.

''ඒකනම් හොඳ අදහසක්'' සුරංගනාවිය කිව්වා.

''මම සුප් එකක් අම්මට කියලා හදාගෙන එන්නම්'' මලී කිව්වා.


ABC

‘‘මම පාන් අරගෙන එන්නම්‘‘සලනි කිව්වා.

‘‘එහෙනම් මං ගානෙ පලතුරු’’ සුරංගනාවියත් කිව්වා.

...........................................................................

‘‘හැමෝම ආව නේද? කෑම බීම ගෙනාව නේද? එහෙනම් අපි යමු’’ සුරංගනාවිය හැමෝමත් එක්ක මිනුලිගේ ගෙදරට යන්න පිටත් වුණා.

‘‘අන්න, අර තියෙන්නේ මිනුලිගේ ගෙදර’’ නිසලි කිව්වා.

‘‘කවුද දැන් දොරට තට්ටු කරන්නේ..?’’

‘‘මම තට්ටු කරන්නම්’’ මලී කිව්වා.

‘‘ටොක්.. ටොක්..’’

‘‘ආ කවුද ඇවිත් ඉන්නේ?’’ මිනුලිගේ අම්මා ඇසුවා.

‘‘මේ අපි අපි, මිනුලිගේ යාලුවෝ’’

‘‘අනේ පුතාලා එන්න ගේ ඇතුලට, ඇවිත් ඉඳගන්න’’ මිනුලිගේ අම්මා අපි හැමෝටම ගේ ඇතුළට ආරාධනා කළා.

‘‘කෝ නැන්දේ මිනුලි?’’

‘‘අන්න අක්කත් එක්ක කාමරේ ඉන්නවා.’’

‘‘මිනුලි ඔයාට දැන් කොහොමද?’’

‘‘උදේට වැඩිය නම් මට දැන් ටිකක් අඩුයි වගේ’’

‘‘ආ මෙන්න. මේවා ඔයාට ගෙනාවේ’’

''ඔය සුප් එක දැන් බොන්න. එතකොට ඔයාට තවත් ඉක්මනට හොඳ වෙයි.''

''ඔයාලට ගොඩක් පිං යාලුවනේ''

''ඔයා බෙහෙත් ගන්න ගියාද මිනුලි?''

''නෑ තාම ගියේ නෑ..අම්මගේ අතේ සල්ලි නෑ''

''එහෙනම් යමු අපිත් එක්ක. මම අම්මගෙන් සල්ලි ඉල්ලගෙන එන්නම්'' මලී කිව්වා.

මිනුලි, අම්මයි සුරංගනාවියයි යාළුවෝ ටිකයි එක්ක ඉස්පිරිතාලයට බෙහෙත් ගන්න ගියා.

මිනුලීයි අම්මයි දොස්තර මහත්තයා ළඟට ගිහින් එනකන් ළමයි හැමෝම එළියට වෙලා බලාගෙන හිටියා.

මලීගේ අම්මා දුන්න සල්ලි වලින් මිනුලිට බෙහෙත් ගන්න පුළුවන් වුණා.
''අපි එහෙනම් ගෙදර යන්නම් පුතාලා. ඔයාලට ගොඩක් පිං'' මිනුලිගේ අම්මා කිව්වා.

ළමයි හැමෝම සුරංගනාවියත් එක්ක පිට්ටනියට ගියා.

''මිනුලි පව් නේද? අපි එයාට තවත් දේවල් ගෙනත් දෙමුද?'' සුරංගනාවිය යෝජනා කළා.

''එහෙනම් ඇඳුම්, සපත්තු, ඉස්කෝලෙට ඕන කරන දේවල් අපි එයාට දෙමු නේද?'' සලනි කිව්වා.

''අපි එක එක්කෙනා එක එක දේවල් භාරගමු. ඊට පස්සේ හෙට ඉස්කෝලේ ඇරිලා මිනුලිලාගේ ගෙදරට ගිහින් ඒ බඩු ටික දෙමු.'' මලී කිව්වා..

පහුවදා හැමෝම පාසල් ආවා. මලී හැමෝගෙන්ම ඇහුවා මොනවද අද ඔයාලා ගේන්නේ කියලා.

''මම මිනුලිට ඇඳුම් ගේනවා'' සඳුනි කිව්වා.

''අපේ අම්මා කිව්වා. මිනුලිගේ අමතර පන්ති වලට සල්ලියි, තව බෑග් එකකුයි පොත් වගේකුයි අරන් දෙන්නම් කියලා'' තිනුම් කිව්වා.

''මම කෑම බීම ටිකක් අරන් එන්නම්'' සලනි කිව්වා.
''එතකොට මලී ගෙන්නේ මොනවාද?''

''අපේ අම්මා කිව්වා. මිනුලිගේ පාසැල් ගාස්තු ගෙවන්නම් කියලා''.
''හරි දැන් අපි පන්තිවලට යමු. බෙල් එකත් ගැහුවනේ.''

පාසල නිමවුණා. හැමෝම ගෙවල් වලට ගිහින් ඉක්මනටම ඇඟපත සෝදගෙන පිට්ටනියට දුවගෙන ආවා. ''කෝ සුරංගනාවිය'' තිනුම් ඇහුවා. ''ආ අර ඉන්නේ'' හැමෝම සුරංගනාවිය ළඟට දුවගෙන ගියා.

''ආ කොහොමද ළමයි?''

''අපි නම් හොඳින් ඉන්නවා.''

''කොයි බඩු ගෙනාවද?''

''අම්මලා අරගෙන එන්නම් කිව්වා.''
''ආ අර එන්නේ අම්මලා'' මලී කෑගහලා කිව්වා.

''මෙන්න ළමයි ඔයාලා ඉල්ලපු බඩු''

''අම්මලාට ගොඩක් ස්තූතියි.'' සුරංගනාවිය කිව්වා.

''අපි එහෙනම් යන්නම්. පුතාලා පරිස්සමට ගිහින් එන්න.''

''එහෙනම් අපි දැන් යමු නේද මිනුලිලාගේ ගෙදර''

''අන්න මිනුලිලාගේ ගෙදර. අද මමයි දොරට කට්ටු කරන්නේ.'' සුරංගනාවි හරිම ආසාවෙන් කිව්වා.

''ටොක්.. ටොක්..,''

''නැන්දේ.... අපි මේ තෑගි ටිකක් ගෙනාවා..''

''මෙච්චර බඩු ගොඩක්. අනේ පුතාලට ගොඩක් පින් සිද්ධ වෙනවා'' මිනුලිගේ අම්මා ඇස් දෙකේ කඳුළු පුරවගෙන කිව්වා.

''මිනුලි කාමරේ ඉන්නවා පුතාලා. ගිහින් කතා කරන්න.''

''මිනුලි දැන් ඔයාට කොහොම ද?'' සඳුනි ඇහුවා.

''දැන් නම් ගොඩක් හොඳයි. හැබැයි දොස්තර මහත්තයා කිව්වා සතියක් විතර හෙඳට විවේක ගන්න කියලා. ඒ නිසා මට ඉස්කෝලේ එන්න නම් බැරි වෙයි.''

''හරි අපි ඔයාට මග ඇරෙන පාඩම් කියලා දෙන්නම්'' හැමෝම කිව්වා.

''අපි එහෙනම් ගිහින් එන්නම්, ඉස්කෝලේ වැඩත් තියෙනවනේ''

හැමෝම සුරංගනාවියත් එක්කම පිට්ටනියට ආවා.

''යාළුවනේ, ඔයාලා හරිම හොඳ ළමයි. ඒ වගේම මටත් දැන් ආපහු දිව්‍ය ලෝකෙට යන්න වෙලාව ඇවිත්. ඇත්තටම මම සතුටු වෙනවා ඔයාලා වගේ ගුණගරුක ළමයි ටිකක් මුණගැහීම ගැන. ''සුරංගනාවිය දුකසේ කිව්වා.

''අනේ යන්න එපා සුරංගනාවී. ඔයා නිසා තමයි අපි හොඳ ළමයි උනේ. ඉතින් අපිව දාලා යන්න එපා.'' ළමයි හැමෝම අඬ අඬ කිව්වා.

'' මට ආයෙත් අවස්ථාවක් ලැබුණොත් ඔයාලව බලල යන්න එන්නම්කෝ... එහෙනම් මම ගිහින් එන්නම්.. ඔයාලට සුභ අනාගතයක්''...

එහෙම කියලා සුරංගනාවි යන්න ගියා. ළමයි හැමෝම ආපහු ගෙදර ගියා.

සුරංගනාවියත් දිව්‍යලෝකෙට ගිහිල්ලා. සුරංගනාවියන්ගේ අම්මටයි තාත්තටයි මේ වෙච්ච සියලු දේම කිව්වා. සුරංගනාවියගේ දෙමව්පියනුත් බෝහෝම සතුටු වුණා.

අවුරුදු ගණනාවක් ගතවුණා. සුරංගනාවියට ආයෙත් පොළොවට යන්න අවස්ථාවක් ලැබුණා. අනේ සුපුරුදු පරිදි යාළුවෝ ටිකම එකතු වෙලානේ. එදා දැක්ක වගේම හැමෝම සතුටින් ඉන්නවා. හැබැයි දැන්නම් යාළුවො ගොඩාක් ලොකුයි. සුරංගනාවිය හිතුවා.

''මෙයාලට නම් දැන් මාව මතකත් නැතුව ඇති'' කියලා.



''කොහොමද යාලුවනේ? ඔයාලට මාව මතකද?''

''අනේ මේ අපේ සුරංගනාවිය නේද. බලන්නකෝ එයාගේ ලස්සන. අපිට කවදාවත් ඔයාව එහෙම අමතක වෙන්නෙ නෑ සුරංගනාවිය. එයානෙ අපි හොඳ ළමයි කළේ.''

හැමෝටම හරිම සතුටුයි. පරණ යාළුවෝ ඔක්කොම මුණගැහුන හින්දා. දැන් ඉතින් හැමෝම ආදරෙන් සතුටින් ලස්සනට ජීවත් වෙනවා....

නිමි....!

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම් වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට ඇවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙනු වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ එකව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ. නම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.

ISBN 978-624-208-368-1